# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

**කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**

**මැණික් සහ ස්වර්ණාභරණ ව්‍යවසායකයන් සඳහා කරනු ලබන**

# ආරාධනයයි

ජපානයේ ඔසාකාහි යුමේෂිමා නගරයෙහි **2025 අප්‍රේල් මස 13 වන දින සිට ඔක්තෝබර් මස13** වන දින දක්වා, පැවැත්වීමට නියමිත **Expo 2025 Osaka, Kansai – Japan**, ජාත්‍යන්තර මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශනය "Designing Future Society for Our Lives" යන තේමාව යටතේ නවෝත්පාදනය, තිරසාරභාවය සහ ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා ගෝලීය වේදිකාවක් නිර්මාණය කිරීමේ අරමුණෙන් මෙවරත් සංවිධානය කරනු ලබන බව සතුටින් දැනුම්දීමට කැමැත්තෙමු. එය 2030 එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සඳහා සහාය දැක්වීමේ ප්‍රධාන ගෝලීය සන්ධිස්ථානයක් වනු ඇත.

ඉහත ප්‍රදර්ශනය සඳහා රටවල් සහ සංවිධාන 150 කට අධික සංඛ්‍යාවක් සහභාගි වන අතර මෙම කීර්තිමත් අවස්ථාවට සහභාගී වන ලෙස ජපාන රජය විසින් ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශ මගින් ශ්‍රී ලංකාවට ආරාධනා කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා මණ්ඩපය සංවිධානය කරණු ලබන අතර මෙහි මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය **2025 ජූලි මස 3 වන සහ 4 වන සතියන්හි** පැවැත්වීමට නියමිත වේ.

ඉහත ප්‍රදර්ශනයේ අධිකාරී මණ්ඩපය තුළ මැණික් සහ ස්වර්ණාභරණ අයිතම ප්‍රදර්ශනය කිරීමට හා ව්‍යාපාරික අවස්ථා පුළුල් කර ගැනිමට කැමැත්තක් දක්වන මැණික් සහ ස්වර්ණාභරණ ව්‍යාපාරිකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ප්‍රදර්ශන අවස්ථා සීමිත සංඛ්‍යාවක් පවතින හෙයින් අයදුම්කරුවන් තෝරා ගැනීම, විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කරනු ලබන අතර මේ සඳහා උනන්දුවක් දක්වන ව්‍යවසායකයින් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ නිල වෙබ් අඩවිය (www.ngja.gov.lk) වෙත පිවිස නියමිත අයදුම්පතේ ආකෘති පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ. **ප්‍රදර්ශනය සඳහා වීසා නිකුත් කිරීම ශ්‍රී ලංකාවේ ජපන් තානාපති කාර්යාලයේ අභිමතය පරිදි සිදු වන අතර තානාපති කාර්යාලය මගින් ගනු ලබන තීරණ සම්බන්ධයෙන් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය කිසිදු වගකීමක් හෝ මැදිහත් වීමක් නොකරන බව කාරුණිකව සලකන්න.**

**"Expo 2025 - Osaka"** ලෙසින් කවරයේ වම් කෙළවර සඳහන් කරන ලද අයදුම්පත් **2025 මැයි 23** වන දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අපනයන ප්‍රවර්ධන අංශය වෙත ගෙනවිත් භාරදිය යුතු වේ.

**වැඩි විස්තර සඳහා අපනයන ප්‍රවර්ධන අංශය අමතන්න.**

**සෘජු දුරකථන : 011-2390653**

**පොදු දුරකථන අංක : 011-2390645 – 8 (දිගුව 333 – 335)**


**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී**

**ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය**

**12,මැක්සන් ටවර්, ඇල්ෆ්‍රඩ් හවුස් උද්‍යානය,කොළඹ 03,**

දුරකථන අංක: 0112390645/8 ෆැක්ස්: 0112320758

විද්‍යුත් තැපෑල - ngjaexportpromotion@gmai.com

**වෙබ් අඩවිය:** www.ngja.gov.lk